කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023**

**2025 අගෝස්තු**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ දර්ශනය
**(නව නිර්දේශය)**

**ආදි බුදුසමයෙහි දාර්ශනික පසුබිම හා බෞද්ධ දර්ශනයේ මූලධර්ම - BUPH 18214**

I සහ II කොටස්වලින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

**I කොටස**

01. මොහෙන්ජොදාරෝ සහ හරප්පා ශිෂ්ටාචාරයන්හි පැවැති ආගමික විශ්වාස පිළිබඳ ප්‍රාමාණික විවරණයක් කරන්න.

02. වෛදික යුගයේ සුවිශේෂතා අදාළ මූලාශ්‍රය හා විද්වත් මත ඇසුරින් පෙන්වා දෙන්න.

03. බමුණු සම්ප්‍රදායය තම ආධිපත්‍ය පවත්වා ගැනීමට අනුගමනය කළ දැඩි ආගමික මතවාද පරීක්ෂාවට ලක් කරන්න.

04. ආරණ්‍යක හා උපනිෂද් යුගවල මූලික ඉගැන්වීම් ලුහුඬින් විස්තර කරන්න.

05. ෂට්ශාස්තෘ දර්ශනාගත අකිරියවාදය, නියතිවාදය සහ පුබ්බේකතහේතුවාදය බෞද්ධ මූලාශ්‍රය අනුව පැහැදිලි කරන්න.

    නැතහොත්

    ඔබගේ අභිරුචිය අනුව ෂට් ශාස්තෘවරුන් අතරින් තිදෙනෙකුගේ මූලික ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.

**II කොටස**

06. මුල් බුදුසමය පිළිබඳ විද්වතුන්ගේ අදහස් සමාලෝචනය කරන්න.

07. සත්ත්වයා හා ලෝකයේ සැකැස්ම පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබා ගැනීම පිණිස පඤ්චස්කන්ධ විභාගයෙන් ලබාගත හැකි පිටිවහල පෙන්වා දෙන්න.

08. ලෝකයෙහි දක්නට ලැබෙන විශ්වසාධාරණ යථාස්වභාවය ත්‍රිලක්ෂණය ඇසුරින් විමර්ශනය කරන්න.

09. ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදය හා ද්වාදසාංග පටිච්චසමුප්පාදය අතර වෙනස පැහැදිලි කරන්න.

10. චතුරාර්ය සත්‍ය මගින් ප්‍රකට වන මිනිස් ජීවිතයේ යථාර්ථය දම්සක් පැවතුම් සූත්‍රය ඇසුරින් පරීක්ෂා කරන්න.

    නැතහොත්

    ආදි බුදුසමයෙහි පැනෙන මධ්‍යම ප්‍රතිපදාවේ පළමු කරුණු පහ (05) ලෞකික දිවිය සාර්ථක කරගැනීමට උපකාර වන ආකාරය පැහැදිලි කරන්න.

*****************************